# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**2053/39 – 2018 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා – 2018.01.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1998 (X)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන අංක පී.වී. 17745 දරන කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී විශ්ව විද්‍යාල පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2017 නොවැම්බර් මස 28 වන දින අංක 2047/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දක්වෙන ''සැපයුම්දාම කළමනාකරනය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව'', යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

I වන උපලේඛනය

***කොන්දේසි***

කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන්ව ඇති උපාධි වැඩ සටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

*(අ)* සංචාරක සහ සත්කාරක කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂය ධාරාවකින් ''S'' සාමාර්ථ තුනක් (03) එකවර ලබා තිබීම' යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතුය;


මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*(ආ)* ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂය ධාරාවකින් ('ඉංග්‍රීසි' ප්‍රධාන විෂය තුනෙන් එකක් විය යුතු) ''S'' සාමාර්ථ තුනක් (03) එකවර ලබා ගැනීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම හෝ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු'ය;

*(ඇ)* භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහ ගණිතය යන විෂයයන් අතරින් 'S' සාමාර්ථ තුනක් (03) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම* |
|---|---|
| සංචාරක හා සත්කාරක කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව. | බීඑම්ජීටී ගෞරව (සංචාරක සහ සත්කාරක කළමනාකරණය) |
| ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඑඩ් ගෞරව (ඉංග්‍රීසි) |
| භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඑඩ් ගෞරව(භෞතීය විද්‍යාව) |

**ලක්ෂ්මන් කිරිඇල්ල,**
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2018 ජනවාරි මස 10 වන දින,
කොළඹ දීය.

01 - 742

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.